# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1927/52 – 2015 අගෝස්තු 13 වැනි බ්‍රහස්පතින්දා – 2015.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සිය පත්තුවේ සුළු කොට්ඨාසයේ, බලකඩුව ගමේ පිහිටි මාතලේ දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරිගේ අංක එම්ඒ/යුකේඩබ්ලිව්/2012/299 සහ 2012.10.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති පන්සල්තැන්න වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්. 6.3062 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පන්සල්තැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 6.3062**
උතුරට: වතුපාර සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන පන්සල්තැන්න වත්ත; නැගෙනහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන පන්සල්තැන්න වත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ තිත්තවැල්ගොල්ල ඇළ; බටහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන පන්සල්තැන්න වත්ත සහ වතුපාර.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 3/3/6/2/22.
2015 මැයි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 826

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, රජ්ජම්මන (අ.ග.පි. 25 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/එම්ටීඑල්/2014/177 සහ 2014.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1509 ක් පමණ වන රජ්ජම්මන නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රජ්ජම්මන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1509 ක් පමණ**

උතුරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට සහ බටහිරට: මඩවල ගම (අ.ග.පි. 23).

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2013/ඩබ්එස්/423.
2015 ජූලි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 827

## අවලංගු කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මගේ යොමු අංකය: නුඑ/3/1/8/අත්පත්/156.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2013/එච්ඩබ්ලිව්/576.

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) යටතේ 2014 ඔක්තෝබර් මස 13 වැනි දින අංක 1884/22 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ 3ඒ ප්‍රසිද්ධ කරන ලද 5 වැනි වගන්තිය යටතේ දැන්වීම මෙයින් අවලංගු කරමි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2015 අගෝස්තු මස 05 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 – 828

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.